# විද්‍යාව තුළ දැකිය හැකි බුදු දහම: ආපසු බැලීමෙන් පෙනී ගිය මූලික සමාන්තරතා කිහිපයක්


ජේ. කේ. පී. ආරියරත්න

රසායන විද්‍යා අංශය, කැලණිය විශ්ව විද්‍යාලය


මේ ලිපියේ ප්‍රධාන අරමුණු දෙකක් වේ. පළමු වැන්න, එක්තරා ස්මරණීය දිනයක කැලණිය විශ්වවිද්‍යාලයේ ප්‍රථම වර්ෂයේ විද්‍යාව හදාරන සිසු සමූහයකට රසායනික බන්ධනවල ස්වභාවය පිළිබඳ උගන්වමින් සිටියදී, විස්මිත ලෙස හා ක්ෂණික ව, මා තුළ ජනිත වී ගිය අවබෝධාත්මක ආලෝක ධාරාවක් පිළිබඳ කරුණු කිහිපයක් බෞද්ධ ලෝකය විසින් ද විද්‍යාඥයින් විසින් ද විද්‍යාත්මක දැනුම පිරික්සීම කෙරෙහි රුචියක් දක්වන වෙනත් අය විසින් ද සලකා බැලීම පිණිස ඉදිරිපත් කිරීම ය. දෙවැන්න නම්, උක්ත මැය පිළිබඳ මීට වඩා පුළුල් සැකිල්ලක්, මගේ අල්ප කුසලතාවල උපරිම පරිශ්‍රමයෙන්, කවරදා හෝ බිහි කිරීම සඳහා ආරම්භක පදනම සකස් කර ගැනීම ය.

ඉකුත් අවුරුදු තිහ පමණ කල් සිට, ප්‍රථම වර්ෂයේ විද්‍යා සිසුන්හට ඔවුන්ගේ පළමු වැනි අධ්‍යයන වාරයේ දී, පදාර්ථයේ පරමාණුක ස්වභාවය හා රසායනික බන්ධනවල ස්වභාව පිළිබඳ මූලික කරුණු මම උගන්වමින් සිටිමි. රසායන විද්‍යාව මැනවින් අවබෝධ කර ගැනීමෙහි හා පසුව එය උපයෝගී කර ගැනීමෙහි ලා අත්‍යවශ්‍යම පදනම වන්නේ මේ ප්‍රාරම්භක දැනුම කොටස ය. සෑම පදාර්ථයක් ම පරමාණුවලින් සමන්විත වන අතර, අන්තිම වශයෙන් සලකන විට රසායනික ප්‍රතික්‍රියා යනු, ප්‍රභේදන් සලකා බලන අවස්ථාවේ දී පරමාණු අතර පවතින රසායනික බන්ධන කැඩී, අලුතින් රසායනික බන්ධන සෑදීම වේ. උක්ත ප්‍රාරම්භක දැනුම කොටස මූලික වශයෙන් වැදගත් වන්නේ මේ හේතුව නිසා ය. ඒ අනුව, රසායන විද්‍යාවේ මුල් ම බීජය හා සාරය වන්නේ පරමාණු හා රසායනික බන්ධන පිළිබඳ වන මේ දැනුම කොටස ය. තව ද, භෞතික විද්‍යාව හා සංකීර්ණ ජීව විද්‍යාත්මක ක්‍රියාවලි අවබෝධ කර ගැනීමෙහි දී ද මෙම දැනුම කොටස අත්‍යවශ්‍ය ම වන පදනම වන්නේ ය.

මීට අවුරුදු තිහකට වඩා පෙර සිට ම, බුදු දහමත් විද්‍යාවත් අතර ඇති සම්බන්ධතාව පිළිබඳ මගේ අවධානය බොහෝ විට නිතැතින් ම යොමුවන්නට විය. මීට එක් ප්‍රධාන හේතුවක් වූයේ මා නියම ඉගෙනුම ලැබූ පාසැල වන ගාල්ලේ මහින්ද විද්‍යාලයේ දී මා ලත් අධ්‍යාපනික හා බෞද්ධාගමික ශික්ෂණය හා ජීවන දර්ශනය ය. අනෙක් ප්‍රධාන හේතුව වූයේ 1970 දී අති උග්‍ර වූ හදිසි හෘදයාබාධයක් මට වැළඳීම ය. හෘදයාබාධයෙන් පසු විවේකී ව රෝහලේ සුවය ලබමින් සිටි මට, බුදු දහමත් විද්‍යාවත් අතර ඇති සම්බන්ධතාව විමසමින් සලකා බැලීම ආරම්භ කිරීම සඳහා නිහඬ අවස්ථාවක් ලැබුණි. බොදුණු පරිසරයක් තුළ පාලි භාෂා අධ්‍යයනයට අනු ගණයේ තැනක් දුන් පාසැලක මූලික ඉගෙනුම් කටයුතු කිරීමට අවස්ථාවක් ලැබීම මගේ මහත් වාසනාවක් විය. මා පාලි භාෂාව ඉගෙන ගත්තේ කණිෂ්ඨ පන්තිය දක්වා පමණි. මා විසින් විද්‍යා හා ගණිත විෂයන් අධ්‍යයනය කිරීමට මුල් තැන දීම නිසා, මගේ එවකට ද අල්ප වූ පාලි දැනුම කාලය සමග ක්‍රමයෙන් හීන වන්නට විය. එසේ වුවත්, පාලි වචන සුළු සංඛ්‍යාවක හෝ ආසන්න තේරුම යන්තමින් වත් අවබෝධ කර ගැනීමට ඇති හැකියාව මා කෙරෙන් සම්පූර්ණයෙන් ම නො ගිලිහුන. ඒ ද මගේ මහත් වාසනාවක් ලෙස මම සලකමි. මුල සිට ම ශ්‍රී ලංකාවේ පූජිත ප්‍රමුඛ ප්‍රකට බෞද්ධ අධ්‍යයන ආයතනයක් වූ කැලණියේ පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙනින් උදා වූ කැලණිය විශ්වවිද්‍යාලය වැනි සුවිශේෂ විද්‍යායතනයක විද්‍යා පීඨයේ සේවයේ නියුක්ත වීමට අවස්ථාවක් ලැබීම උක්ත වාසනාව තව දුරටත් වර්ධනය කළේ ම ය. මේ නයින්, බුදු දහම සහ විද්‍යාව අතර ඇති සම්බන්ධය විෂයානුබද්ධ ව පිරික්සීමට මා තුළ ඇති වූ ආශාව තව තවත් තර විය. ඇත්ත වශයෙන් ම, කැලණිය විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨයට වසර 25 ක් සපිරීම නිමිත්තෙන් නිකුත් කෙරෙන මෙම සමරු කලාපට '<u>විද්‍යාව තුළ දැකිය හැකි බුදු දහම</u>' යන මැයෙන් මේ ලිපිය ලිවීමට මා දිරිමත් කළ සාධක අතර, ගාල්ලේ මහින්ද විද්‍යාලයත් කැලණිය විශ්ව විද්‍යාලයත් යන ආයතන දෙක ම සමග ආශ්‍රිත සුවිශේෂ බෞද්ධ සම්ප්‍රදායික ලක්ෂණ ද, මා අසම්පූර්ණ වශයෙන් පමණක් තේරුම් දන්නා පාලි වචන කිහිපය ද, මුල් තැන ගන්නා බව පැවසීම හැම අතින් ම සත්‍ය වේ.